# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී සිද්ධාර්ථ පදනම (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී සිද්ධාර්ථ පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විදුර වික්‍රමනායක මහතා විසින්
2013 ජූනි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[249 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007332—750 (2013/06)

## ශ්‍රී සිද්ධාර්ථ පදනම (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී සිද්ධාර්ථ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පූර්විකාව.

“ශ්‍රී සිද්ධාර්ථ පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී පදනම සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් හොරණ, ගෝනපොල හන්දියේ තලගල පිහිටුවා ඇති හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද එකී සියලු පරමාර්ථ හා කරුණු එකී පදනම විසින් ක්‍රියාත්මක කරනු ලැබ සහ ඉටු කරනු ලැබ ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරන ලෙස එකී පදනම විසින් ඉල්ලුම් කරනු ලැබ ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක දරන “ශ්‍රී සිද්ධාර්ථ පදනම” (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී සිද්ධාර්ථ පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී සිද්ධාර්ථ පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් ලෙස බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් හඳුන්වනු ලබන) “ ශ්‍රී සිද්ධාර්ථ පදනම” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වන්නේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද සහ එය භාවිතා කිරීමේ ද තම කැමැත්ත අනුව එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය.

2—PL 007155 -75 (2013/04)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බෞද්ධ සංස්කෘතිය වර්ධනය කිරීම උදෙසා ද, සදාචාර වර්ධනය උදෙසා ද, අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම;

(ආ) ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපන ආයතන සහ නේවාසිකාගාර පිහිටුවා නඩත්තු කිරීම, අසරණ දුප්පත් ළමයින්ගේ අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) දුප්පත් ශිෂ්‍යයන්ට මූල්‍ය ආධාර දීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඈ) ස්වාභාවික ආපදාවලදී ඒවාට ලක් වූ අයට අවශ්‍ය ආධාර කිරීම ;

(ඉ) සමාජ සේවා කටයුතු ඉටු කිරීම ;

(ඊ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය පහසුකම්, පෝෂ්‍ය ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස සැපයීම ;

(උ) අඳ, ගොළු සහ බිහිරි තැනැත්තන් සඳහා ශුභසාධක කටයුතු පහසුකම් සැලසීම ;

(ඌ) මහලු නිවාස පිහිටුවා පවත්වා ගෙන යාම ;

(එ) සංස්කෘතික කටයුතුවල නිරතවීම ;

(ඒ) සිංහල, පාලි, සංස්කෘත, බුද්ධ ධර්මය, ආයුර්වේද විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා පාඨමාලා පැවැත්වීමෙන් ගිහි පැවිදි දෙපක්ෂයේම අධ්‍යාපනය නංවාලීම ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) ධර්ම දේශනා, බුද්ධ පූජා, චෛතීය පූජා, බෝධි පූජා භාවනා පන්ති, සාකච්ඡා, සම්මන්ත්‍රණ, දේශන සහ චාරිකා පවත්වාගෙන යාම;

(ඕ) ආයුර්වේද සහ දේශීය වෛද්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සහ ඖෂධ පැළැටි වගා කිරීමට ධෛර්යය දීම ;

(ක) ජාතිය සහ ආගම නොතකා ජනතාව අතර අන්‍යොන්‍ය අවබෝධය සහ සහයෝගීතාව වැඩිදියුණු කිරීම ;

(ග) පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති ඇති කිරීම සහ ඒවා නඩත්තු කර පවත්වාගෙන යාම ;

(ජ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම ;

(ට) ශිෂ්‍යයන්ට කුඩා කර්මාන්තවල පුහුණුව ලබා දීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් උපකාර කිරීම ;

(ඩ) පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා නඩත්තු කිරීමෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීමේ සහ ප්‍රවර්ධනය කිරීම ;

(ත) ප්‍රජා සංවර්ධන අධ්‍යාපන ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම හා ප්‍රජා සංවර්ධන කාර්යයේ ලා අදාළ වන ව්‍යාපෘති සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ප) ශ්‍රී සිද්ධාර්ථ පදනමේ ග්‍රාමීය සමාජ ශාඛා පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(බ) ජනතාවට තාක්ෂණික විශේෂඥතාව ලබා දීම අරමුණු කොට ගෙන යම් කර්මාන්තයක, වෘත්තියක හෝ අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සහ යම් කෘෂිකාර්මික, කාර්මික සහ ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම සහ කරගෙන යාම, එවැනි ව්‍යවසායන් සඳහා යම් තැනැත්තෙකුට ආධාර සහ උපකාර කිරීම, පුහුණු කිරීමේ වැඩපිළිවෙලවල් පවත්වාගෙන යාම සහ සේවා ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම ;

(ට) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි ලා නිරතවන ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ වෙනත් ආකාරයකින් ආධාර දීම ;

(ය) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත් සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම ;

(ර) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රදර්ශන දේශන සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(ල) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති, හෝ සංවිධාන සමග සහයෝගීවීම හා සහචර්යවීම ;

(ව) සංස්ථාවේ පරමාර්ථ සියල්ලට ම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීමට අවශ්‍ය වන වෙනත් පියවර ගැනීම ;

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය.

(අ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත සිටින තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදානයන් හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) යම් බැංකුවක ජංගම ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් සුදුසුයයි සලකනු ලබන සුරැකුම්පත්වල සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය සියලු කොන්ත්‍රාත්වලට සහ ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම ;

(ඉ) සංස්ථාවේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම සහ ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියා මාර්ග ගැනීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

**5.** (1) සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු අතර, එලෙසම ක්‍රියාත්මක විය යුතු ය. තව ද, සංස්ථාවේ ලාභවල හෝ ලාභාංශවල කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය.

(2) සංස්ථාව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක දී සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා පියවනු ලැබීමෙන් පසුව ඉතිරිවන සියලුම වත්කම් හුදෙක් පුණ්‍ය කාර්ය හෝ අධ්‍යාපනික කාර්ය සඳහා පිහිටුවනු ලැබ ඇති හෝ සංවිධානය කර ඇති යම් අරමුදලක හෝ සංවිධානයක යහපත සඳහා ම පමණක් යොදවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරනු ලබන්නා වූ ද, එකී රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සංඛ්‍යාවක් වන්නා වූ ද, නිලධරයන්ගෙන් සහ වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් එකී රීතිවලට අනුව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ මෙහි උපලේඛනයේ සඳහන්වන පදනමේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන පදනම විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**8.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවක් විසින් කලින් කල සාදනු ලැබිය හැකි ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝර පත් කිරීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල චර්යාව සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව කාර්ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සාමාජිකයන්ගේ බලතල, චර්යා, කාර්ය, සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, රැස්වීම්වල දැන්වීම්, න්‍යාය පත්‍ර ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කරනු ලැබිය යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම ;

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ රීතියක්, ඒ රීතිය (1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමකදී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ බලපැවැත් වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු හා පදනමට අයවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලුම ණය බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලුම ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් මගින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල හා නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එකී සියලු දේපල සංස්ථාව විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ මුද්‍රාව පාලක මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු අතර, පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව, සහ ඒ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස ඒ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිභාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**13.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

(6 (2) වගන්තිය)

**උපලේඛනය**

කළමනාකරණ මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් : | පූජ්‍ය තලගල සුමනරතන හිමි |
| ලේකම් : | කේ. එස්. පෙරේරා මහතා |
| භාණ්ඩාගාරික : | පී. එච්. ලීලාරත්න මහතා |
| සෙසු සාමාජිකයන් : | බී. පී. ජයතුංග මහතා<br>එම්. ආර්. කරුණාතිලක මහතා<br>ගාමිණී ජයන්ත අබේවික්‍රම මහතා<br>ඩබ්. ඩී. අබේසේකර මහතා<br>ජයසේන ජයකොඩි මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.